**මොහාන් විජේවික්‍රම**
**மொஹான் விஜேவிக்ரம**
**Mohan Wijewickrama**
**නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර**
**கிழக்கு மாகாண ஆளுநர்**
**Governor of the Eastern Province**


G/EPC/A/Memo

2012.12.14

බෙදාහැරීම බලන්න

**ආණ්ඩුකාර සංදේශ අංක 03/2012**
**නැගෙනහිර පළාත් රාජ්‍ය සේවකයන්ගේ ස්ථාන මාරුවීම්**

වාර්ෂිකව දැනට අනුගමනය කරන පළාත් රාජ්‍ය සේවකයින්ගේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමේදී නිලධාරින් මුහුණ දෙන ප්‍රායෝගික ගැටළු පිළිබඳව දිගින් දිගටම කරනු ලැබූ අභියාචනා සැලකිල්ලට ගෙන 2014 වර්ෂයේ වාර්ෂික මාරු ක්‍රියාත්මක කිරීමේදී දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදයට අමතරව පහත සඳහන් කරුණු කෙරෙහි සියලුම පළාත් බලධාරින්ගේ සහ මාරුවීම් මණ්ඩලවල අවධානය යොමු කිරීමට 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වගන්තිය ප්‍රකාරව මාහට පැවරී ඇති බලතල ප්‍රකාරව උපදෙස් දෙමි.

1. සෑම විටම වසර 05කට වැඩි සේවා කාලයක් එකම ස්ථානයක සේවය කරන ලද නිලධාරින් මාරු කිරීමේදී ඔවුන්ගේ ගෘහස්ත සහ පෞද්ගලික ගැටළු  අවම කිරීම මූලික අරමුණ කොටගෙන එම නිලධාරින් හැකිතාක් දුරට එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුලම ඇති පළාත් සභා සහ පළාත් පාලන ආයතන අතර මාරු කිරීම් කල යුතුය. යම් හේතුවකින් එසේ කිරීමට නොහැකි වූයේ නම් එවැනි නිලධාරින් හට යාබද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ඇති පළාත් සභා/පළාත් පාලන තනතුරුවල පුරප්පාඩු ඇත්නම් මාරුකිරීම සිදුකල හැක. කෙසේ වුවද යම් නිලධාරියෙකු අඛණ්ඩව එකම අමාත්‍යාංශයක හෝ ඒ හා අනුබද්ධිත දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක හෝ කාර්යාලවල (උදා. සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂක කාර්යාලය, වෛද්‍ය නිලධාරී කාර්යාලය සහ රෝහල) දිගටම වසර 05කට වැඩියෙන් සේවයකල නොහැකි අතර එවැනි නිලධාරින් ස්ථාන මාරු සඳහා ඇතුලත් කල යුතුය.

2. යම් කිසි නිලධාරියෙකු හුදෙක්ම එකම ස්ථානයක සේවයකර තම ගම්බිම් හෝ තමන් කැමති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක පිහිටි ස්ථානයක පළාත් සභා/පළාත් පාලන තනතුරක් සඳහා මාරුවීමක් ඉල්ලුම්කලවිට එම මාරුව ක්‍රියාත්මක කල යුත්තේ එසේ ඉල්ලන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෝ එයට ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇති පළාත් සභා/පළාත් පාලන ආයතනයක තනතුරක් පුරප්පාඩු වී ඇත්නම් පමණී. (තම ගම්බිම් ආසන්නයට පැමිණීමට අවශ්‍ය කරන නිලධාරියාට තම ප්‍රදේශයට මාරුවක් ලබාදීමට එම ප්‍රදේශයේ දැනට සේවය කරන නිලධාරියෙක් තමා සේවය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හෝ ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් බැහැරව වෙනත් දුර බැහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක පළාත් සභා/පළාත් පාලන තනතුරක් සඳහා මාරුකර නොයැවිය යුතුය).

මොහාන් විජේවික්‍රම
ආණ්ඩුකාරවර
නැගෙනහිර පළාත

බෙදාහැරීම :- සම්පූර්ණයි


ආණ්ඩුකාර කාර්යාලය, ඕර්ස්හිල් පාර, ත්‍රිකුණාමලය.
ஆளுநர் செயலகம், உவர் மலை வீதி, திருக்கோணமலை.
Governor's Secretariat, Orr's Hill Road, Trincomalee.

කාර්යාලය, දුරකථන අංක / அலுவலகத் தொலைபேசி / Office Telephone: 026-2222102
ෆැක්ස් / பெக்ஸ் / Fax: 026-2222320
නිල නිවස / வதிவிடம் / Residence: 026-2220012